# සංක්ෂිප්තය


අධ්‍යාපන සම අවස්ථාවල ප්‍රධාන අංගයක් වනුයේ අධ්‍යාපන සාධනයයි. විධිමත් අධ්‍යාපනයට සම්බන්ධ වන දරුවා එක ශ්‍රේණියේ සිට විධිමත් විෂයමාලාවක් ඔස්සේ අධ්‍යාපන ක්‍රියාවලියේ නිරත වේ. මෙම විෂයමාලාව හදාරණ දරුවා අධ්‍යාපන ප්‍රගතිය සඳහා ලභාවිමට නම් ඉහළ සාධන මට්ටමක් ලබාගත යුතුය.

වර්තමානයේ අධ්‍යාපනය ආයෝජනයක් සේ සලකන හෙයින්ද, සම අධ්‍යාපන අවස්ථා සැලසීම අපේක්ෂා කරන හෙයින්ද, සම්පත් නාස්තිය අවම කර අධ්‍යාපනයේ උපරිම ප්‍රතිලාභ සිසුන්ට අත්පත් කර දීමට පියවර ගැනීම සඳහා අ.පො.ස. (උ.පෙළ) සිසුන්ගේ ආර්ථික විද්‍යා විෂය සාධනය කෙරෙහි බලපාන සාධක විමසීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය.

අධ්‍යාපන සාධනයට බලපාන සාධක අතර ඇති සම්බන්ධතාවය අනාවරණය කරන දේශීය හා විදේශීය අධ්‍යයන අනාවරණ මෙම පර්යේෂණය සඳහා ආධාර කර ගන්නා ලද අතර ප්‍රධාන අරමුණු පහක් ඔස්සේ අධ්‍යයනය සැලසුම් කරන ලදී.

ආර්ථික විද්‍යා විෂය සාධනය කෙරෙහි පාසල හා සම්බන්ධ සාධක, ශිෂ්‍යයා සම්බන්ධ සාධක, ශිෂ්‍යයාගේ පවුල් පසුබිම සම්බන්ධ සාධක හා විෂය ධාරාව අනුව ආර්ථික විද්‍යා විෂයේ සාධන වෙනස්කම් පිළිබඳව විමසා බැලීම එම අරමුණු වලට අයත් විය.

අධ්‍යයනය සඳහා අවශ්‍ය දත්ත රැස් කිරීමට නියැදි කිහිපයක් තෝරා ගන්නා ලදී. තඹුත්තේගම අධ්‍යාපන කලාපයේ 1 AB හා 1 C පාසල් යන පාසල් වර්ග දෙකෙන්ම පාසල් හයක් ද විදුහලපතිවරුන් හා අංශ ප්‍රධාන ගුරුවරුන් හය දෙනා බැගින් ද ආර්ථික විද්‍යා විෂය උගන්වන ගුරුවරුන් 20 ක් ද 2006 වර්ෂයේ කලා හා වාණිජ විෂය ධාරා යටතේ ආර්ථික විද්‍යා විෂය යටතේ විභාගයට පෙනී සිටි ශිෂ්‍යයින් 180 ක් ද එම නියැදිවලට අයත් වූ අතර, නියැදි සමීක්ෂණ ප්‍රවේශය ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා මගින් දත්ත රැස් කෙරිණි. ප්‍රතිශත හා සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රම මගින් දත්ත විශ්ලේෂණය සිදු කෙරිණි. අවශ්‍ය අවස්ථාවල ප්‍රස්තාර හා රූප සටහන් ද යොදා ගැනිණි.

දත්ත විශ්ලේෂණයේ දී අනාවරණය වූ කරුණු අනුව පාසල් ආශ්‍රිත සාධක ආර්ථික විද්‍යා විෂය සාධනය සමඟ සම්බන්ධතාවක් දක්වන බව නිගමනය විය.

අධ්‍යාපන සාධනය කෙරෙහි එක් එක් විචල්‍යයයේ බලපෑම වෙනස් විය. ගුරුවරයාගේ පළපුරුද්ද, ඉගැන්වීම් සංවර්ධන උපායමාර්ග, පාසල්වල පුස්තකාල පහසුකම්, සෘජු ලෙස ශිෂ්‍යයාගේ විෂය සාධනය කෙරෙහි බලපෑම් ඇති කළ විචල්‍යයන් විය.

විෂය නිර්දේශ ආවරණය, ඇගයීම් සිදුකිරීම, ඉගැන්වීම් සංවිධානය කිරීම යන විෂයමාලා කලමනාකරණය ආශ්‍රිත සාධක ශිෂ්‍යයන්ගේ විෂය සාධනය කෙරහි බලපෑ විශේෂ වූ විචල්‍යයන් විය.

කලා විෂය ධාරාව යටතේ ආර්ථික විද්‍යාව හදාරණ සිසුන්ගේ විෂය සාධනයට වඩා වාණිජ විෂය ධාරාව හදාරණ සිසුන්ගේ ආර්ථික විද්‍යා විෂය සාධන මට්ටම ඉහළය. එමෙන්ම වාණිජ විෂය ධාරාව යටතේ ඉගෙන ගන්නා විෂයයන් ද ආර්ථික විද්‍යා විෂය හැදෑරීමට පිටිවහලක් වේ.

ශිෂ්‍යයන්ගේ පැමිණීම, ප්‍රශ්නපත්‍ර පුනරීක්ෂණය, අමතර දැනුම ලැබීමේ මූලාශ්‍ර, බාහිර කාර්යයන් සඳහා පෙළඹීම ආර්ථික විද්‍යා විෂය සාධනය කෙරෙහි ශිෂ්‍යයා සම්බන්ධ සාධක අතරින් බලපෑම් ඇති කළ විචල්‍යයන් ලෙස නිගමනය විය.

ශිෂ්‍යයාගේ පවුලේ සමාජ හා ආර්ථික සාධක ද සාධනය කෙරෙහි බලපා ඇත. නිවසේ යහපත් ඉගෙනුම් පරිසරයක් ලෙස විද්‍යුත් සන්නිවේදන මාධ්‍ය භාවිතය පුවත්පත් මිලදී ගැනීම ආදී සාධක ද පවුල් පසුබිම ආශ්‍රිතව ආර්ථික විද්‍යා විෂය සාධනය කෙරෙහි බලපා ඇත.

ඒ අනුව පාසල හා සම්බන්ධ, ශිෂ්‍යයා සම්බන්ධ, පවුල් පසුබිම හා සම්බන්ධ, විෂය ධාරාව හා සම්බන්ධ සාධක අ.පො.ස. (උ.පෙළ) සිසුන්ගේ ආර්ථික විද්‍යා විෂය සාධනය කෙරෙහි බලපාන සාධක බව මෙම අධ්‍යයනයෙන් අනාවරණය විය.

සිසු සාධනය නැංවීම සඳහා ගතහැකි පියවර කිපයක් යෝජනා කිරීමට ද අනාගතයේ දී පර්යේෂණයට භාජනය විය යුතු ක්ෂේත්‍ර කිපයක් පෙන්වා දීමට ද අවසානයේ හැකිවිය.

අධ්‍යයන ක්‍රියාවලියේ නිරතවන්නන් අභිමත ප්‍රාප්ති මට්ටම ලඟා කර ගැනීම සමාජයේ ප්‍රගතියට හේතු වන අතර, රටේ සංවර්ධනයට උරදිය හැකි ආයෝජකයන් පිරිසක් බිහි කිරීමට ද එය මහත් වූ රුකුලක් වනු ඇත.